**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 මැයි මස 21 වන දින සිට මැයි මස 27 වන දින දක්වා**

**ශුද්ධාත්ම ගින්නට හසු වූ මිනිසා සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයෙකි**

01. ආරම්භක ප්‍රශංසාව

පුබුදු ගී අංක 05 " ශ්‍රද්ධා වීර්ය ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

**"තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබුවන්ට, එනම් ඔවුන් වහන්සේට ප්‍රේම කරන අයට සියල්ලේදීම ඔවුන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු."** (රෝම 8:28)

ඔබ/මම දෙවි මහෝත්තමයාණන්ගේ අදහස ලෙස කැඳවනු ලැබුවන්ය. අපේ ජීවිතයේ අපි පසු කරන අසීරු, අමිහිරි, අසාර්ථක අත්දැකීම් අයහපත් යැයි අපට හැඟුනද ඒ සියල්ලේදීම අප සමඟ සිටිමින් අපට ප්‍රේම කරන දෙවි සමිඳාණෝ සියල්ලේදීම අපේ යහපත පිණිස ක්‍රියා කරන සේක. ඔවුන් වහන්සේට අපේ මුළු හදවතින්ම ස්තූති ප්‍රශංසා කරමු.
පුබුදු ගී අංක 95 "ඔබ තෝරා ගත්...."

03. දවසේ සුපුවත :

කිතු දන පුබුදුව මේ ශ්‍රී ලක් දේශය තුළ, ලෝකය තුළ බිහි වීම, එය සභාවට - සමාජයට ආලෝකයක් වීම දෙවියන් වහන්සේගේ සිතෙහි තිබූ ශුද්ධවූ සැළැස්මකි. අරමුණකි. එය ඉටුකර ගැනීමට දෙවියන් වහන්සේ තෝරා පත් කළ මිනිසා ස්වාමි තාත්තා ය.
කලකිරීම, පීඩාව, අරගලය, එපාවීම තුළ ශුද්ධාත්ම ස්නාපනයක් ලබන්නට තරම් ගින්නක් එතුමා තුළ ඇති කරන ලදදේ ශුද්ධාත්මයාණන් වහන්සේම ය. එය එලෙස සිදුවීම දක්වා වූ ක්‍රියාකාරීත්වය තුළ ක්‍රියා කරන ලද්දේ ද ශුද්ධාත්මයාණන් වහන්සේම ය.

උදා :

* කලකිරීම, එපාවීම සමඟ තම ශ්‍රේෂ්ඨයාව මුණ ගැසී බෙදා ගැනීම.
* එතුමන්ගේ ප්‍රතිචාරය, නිවාඩුවකට විදෙස් රටකට යැවීම.
* ස්වාමි තාත්තාව බාරව සිටි පියතුමා එංගලන්තයේ පවුලක් වෙත ස්වාමි තාත්තාව යොමු කිරීම.
* ඔවුන්ගේ ජීවිත පැවැත්ම ස්වාමි තාත්තාට බලපෑම.
* සෑම දෙයකටම දේව කැමැත්ත විමසීම.
* පවුලේ යාච්ඤාව, ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයට ඉඩදීම, අන්‍ය භාෂාවෙන් යාච්ඤා කිරීම, හිසමත අතතබා යාච්ඤා කිරීම

ඔවුන්ගේ යාච්ඤා මෙහෙයකට සහභාගි වූ ස්වාමි තාත්තා හට කිසි දිනක අත් නොදුටු ශුද්ධාත්ම ස්පර්ශයක්, ශුද්ධාත්ම ගින්නෙන් ඇවිලීමක් අත්දැකීමට හැකිවිය. ස්වාමි තාත්තා පූර්ණ සුවයක්, ඇතුලාන්ත නිදහසක් අත්දැක්කා. එපමණක් නොව දේවකැමැත්ත ඉටු කිරීමේ ගින්නෙන් ඇවිළුණේය. ඒ ඇවිළුනු ගින්න මොනතරම් ප්‍රබල වූවාද කිවහොත් නැවත ලංකාවට පැමිණි ස්වාමි තාත්තාට මුහුණ දෙන්නට සිදුවූ අභියෝගය ඉදිරිපිට දේව කැමැත්ත ඉටු කරන්නට, දෙවියන් වහන්සේ තුළ යැපෙන්නට, දෙවියන් වහන්සේට ඉඩ දෙන්නට හැකි අභ්‍යන්තරයක් ශුද්ධාත්මයාණන් වහන්සේ ඇති කරන ලදී.

උදා:

* ලංකාව තුළ හටගෙන තිබූ ගින්න (තරුණ කැරැල්ල) ස්වාමි තාත්තා තුළ බියක්, තැති ගැන්මක් ඇති කිරීමට හේතුවක් වුවද, එයට මුහුණ දීමේ ශුද්ධාත්ම ස්පර්ශයක් එතුමා තුළ විය.
* රහස් පොලිසිය හතරවන තට්ටුවට ස්වාමි තාත්තාව රැගෙන යාම. එහිදී මුහුණ දුන් අත්දැකීම තුළත් ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය අත්දැකීම.
* දේව හඬට සවන්දීම තුළ ශු.ලූක් 21:14-15 වගන්ති අයිති කර ගැනීමට හැකිවීම.
* දෙවියන් වහන්සේගේ වචනය ගින්නක්, කුළු ගෙඩියක්, දෙමුහත් කඩුවක් ලෙස අත්දැකීමට හැකිවීම.

* එහි ප්‍රතිඵලයක් ලෙස ස්වාමි තාත්තාගෙන් ප්‍රශ්න කළ නිළධාරින් ප්‍රකාශ කළ වචනය, 'ඔබතුමාගේ ව්‍යාපාරයට අපට දිය හැකි සහයෝගයක් තිබෙනවා නම්, එය දීමට අප සූදානම්'. ස්වාමි තාත්තා දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස කළා,
**"ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි"**

* ස්වාමි තාත්තා අත්දුටු ඒ විශ්වාසය එතුමාගේ ජීවිතයෙන් ප්‍රකාශ වේ. මේ සියල්ල දෙස බලද්දී අපට පෙනෙනුයේ කිතු දන පුබුදුව ආරම්භ වීම දෙවියන් වහන්සේගේ සිතේ තිබුණු සැළැස්මක් බවත්, ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් එය ආරම්භ කර හසුරුවන බවත්ය. ඒ නිසයි ස්වාමි තාත්තා හැම විටම ප්‍රකාශ කලේ කිතු දන පුබුදුව ආරම්භ වීම දෙවියන් වහන්සේගේ සෙවරීය ක්‍රියාවක් බව.

04. අප දෙසට : (සාකච්ඡාව සඳහා)

1. කිතු දන පුබුදු ජනතාවක් ලෙස, ශ්‍රී ලංකා දේශය තුළ බිහි වූ ශුද්ධාත්ම පිබිදීමේ ගින්නට හසු වූ කෙනෙකු ලෙස මගේ ජීවිත ක්‍රියාකාරිත්වය කෙබඳුද?
2. ශුද්ධාත්ම ස්නාපනය ලැබුවකු ලෙස, අභියෝගයන්ට මුහුණ දීමේදී දෙවියන් වහන්සේ හා මගේ සම්බන්ධතාවය කෙසේද?
   * දේව හඬට සවන් දීම
   * දේව සිත විමසීම
   * විශ්වාසයේ ජීවිතය .
   * සාංඝික ජීවිතය

05. හතර දෙනාගේ කණ්ඩායම් ලෙස ශුද්ධාත්ම ස්නාපනය පතා යාච්ඤා කරමු.

පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ..."

******************